صفة الوضوء والصلاة (مرئي)

මා වුළු "අර්ධ ධෝවනය" කළ යුත්තේ කෙසේද?

අනුක්රමය

ශබ්දය

1

'අදාන්' -සලාතය සඳහා වූ ඇරයුමෙහි- ශබ්දය.

2

{يَا أَيُّهَا الَّذِينَ آمَنُوا إِذَا قُمْتُمْ إِلَى الصَّلَاةِ فَاغْسِلُوا وُجُوهَكُمْ وَأَيْدِيَكُمْ إِلَى الْمَرَافِقِ وَامْسَحُوا بِرُءُوسِكُمْ وَأَرْجُلَكُمْ إِلَى الْكَعْبَيْنِ}

අහෝ විශ්වාස කළවුනි ! නුඹලා සලාතයට සූදානම් වූ විට නුඹලාගේ මුහුණු ද නුඹලාගේ අත් මැණික් කටුව දක්වා ද සෝදා ගනු. තවද නුඹලාගේ හිස් (ජලයෙන්) පිරිමදිනු. තවද නුඹලාගේ පාද ද වළලු කර දක්වා සෝදා ගනු.

(සූරා අල් මාඉදා:6)

3

වුළු හෙවත් අර්ධ ධෝවනයෙන් තොර ව සලාතයක් නැත. චේතනාවෙන්

තොරව අර්ධ ධෝවනයක් නැත. අවංකභාවයෙන් තොර ව චේතනාවක් නැත. චේතනාව වනාහි එහි නියමිත ස්ථානය හදවතයි. දිව නොවෙයි.

4

අල්ලාහ්ගේ නාමයෙන්

වුළු ධෝවනය ආරම්භයේ 'තස්මියා' නොහොත් බිස්මිල්ලාහ් යැයි පැවසීම දහම් ගත කරනු ලැබ ඇත. එහෙයින් අපි එමගින් අපගේ වුළු ධෝවනය ආරම්භ කරමු. පසු ව හැකි නම් මුඛය පිරිසිදු කිරීම සඳහා මිස්වාක් දැහැටිය භාවිතා කරමු.

5

තුන් වරක් අපගේ දෙඅත්ල සෝදමු. එනම් ඇඟිළි තුඩුවලින් ආරම්භ කොට මැණික් කටුව දක්වා සෝදමු.

6

දෙඅත්ල මැණික් කටුව දක්වා තුන් වරක් බැගින් එකිනෙකට පසු ව සෝදමු.

7

දකුණු අත්ල සේදීමෙන් ආරම්භය සිදු වන අතර අපි එය තුන්වරක් සෝදමු. ඉන්පසු වම් අත්ල තුන්වරක් සෝදමු.

8

මෙලෙසම දකුණු අත්ල ද පසු ව වම් අත්ල ද පසු ව දකුණු අත්ල ද පසු ව වම් අත්ල ද... යනාදී ආකාරයෙන් සේදීම ද අනුමත වන්නේය.

9

ඒ සමගම අපගේ ඇඟිලි අතරට ජලය ඇතුළු කිරීමට වගබලා ගත යුතුය.

10

පසු ව මුඛය කළත්වා පිරිසිදු කිරීමටත් නාසය පිරිසිදු කිරීමටත් යොමු වෙමු.

11

මුඛය පිරිසිදු කිරීම යනු ජලය මුඛය තුළ තබා එහි ඇතුළත කළත්වා පසු ව එය එළියට ගෙන බැහැර කිරීමෙන් සිදු වන්නේය.

12

නාසය පිරිසිදු කිරීම යනු හුස්ම ගැනීමත් සමඟ ජලය නාසය තුළට ඇද ගැනීමට සලස්වා පසු ව වමතින් නිස්සාරණය කරමින් එය බැහැරට ගැනීමය.

13

උපවාස රකින්නන් ලෙස අප නොසිටින තාක් හෝ හානියක් ඇති වනු ඇතැයි බිය නොවන තාක් මුඛය හා නාසය ගැඹුරින් කළත්වා පිරිසිදු කිරීම නබි පිළිවෙත අතරිනි.

14

කට පිරිසිදු කිරීමටත් නාසය පිරිසිදු කිරීමටත් ක්රම දෙකක් ඇත.

15

දිගටම සේදීම: එනම් අතින් මිටක් ජලය ගෙන ඉන් අඩකින් කට පිරිසිඳු කර ගනිමු. අනෙක් අතින් නාසය පිරිසිඳු කර ගනිමු.

කටෙහි ඇති ජලය කළත්වා පසු ව එය බැහැර කරමු. අනතුරු ව නාසයට ගත් ජලය වමතින් සෝදා එය බැහැර කරමු.

මෙය ජල අහුරු තුනකින් තුරන්වරක් සිදු කරමු.

16

වෙන් වෙන්ව සේදීම: එනම් නාසය පිරිසිදු කිරීම සඳහා වෙනත් අහුරක් ගැනීම. අපි ජල අහුරක් ගෙන එය සම්පූර්ණයෙන් මුඛය තුළට යවා පසු ව එය කළත්වා පසු ව එය එළියට දමමු. පසු ව දෙවන වරට ජල අහුරක් ගෙන එමගින් නාසයට ඇදෙන්නට සලස්වා පසු ව වමතින් නාසය පිරිසිදු කර බැහැර කරමු.

17

මුඛය හා නාසය පිරිසිදු කිරීමෙන් පසු ව මුහුණ සේදීම.

18

මුහුණෙහි සීමාව සිරස් අතට: කෙස් කළඹ වැවෙන ස්ථානයේ සිට උගුරු

දණ්ඩේ කෙළවර දක්වා හා තිරස් අතට දෙකන් අතර වූ සීමාවයි.

19

මෘදු ලෙස වැවී ඇති යටි රැවුල, උඩු රැවුල, ඇහි බැමි, ඇසිපිය රෝම, යටි තොලට පහළින් නිකටෙහි වැවෙන රැවුල් යනාදී ලෙස මුහුණෙහි පවතින සියලුම රෝම සෝදා හැරීම අනිවාර්යය වෙයි.

20

මුහුණ සේදීමට ද ක්රම දෙකක් ඇත:

21

පළමුවැන්න: දෑත් දෙකින්ම ජලය ගෙන ඒ දෙකින් සුපුරුදු පරිදි හිස් කළඹ වැවෙන ස්ථානයන්හි සිට උගුරු දන්ඩෙහි කෙළෙවර දක්වා ඇති සීමාවත් දකුණු කනෙහි සිට වම් කන දක්වා ඇති සීමාවත් සෝදමු. යටි රැවුල ඝනව පිහිටියේ නම් රැවුලට යටින් ජලය පිවිසෙන්නට සලස්වා රැවුල විහිදුවා

සේදීම සුන්නාවක් (නබි චරිතයක්) වන්නේය.

මෙය වාර තුනක් අපි ක්රියාවට නංවමු. එයයි පූර්ණත්වය වනුයේ. එසේ නැතහොත් දෙවතාවක් හෝ එක්වතාවක් හෝ ක්රියාවට නංවමු. එක්වතාවක් ක්රියාවට නැංවීම අනිවාර්ය වේ.

22

දෙවැන්න: දකුණතින් පමණක් ජලය ගෙන පසු ව මුහුණ මත වක්කර පෙර ක්රමය පරිදි අත් දෙකින්ම මුහුණ සෝදමු. එය ද තුන්වරක් සිදු කරමු.

23

යම් අවයවයක් නිශ්චිත අවයවයක ස්ථානයට පෙර සෝදා නොහැර වුළූහි අවයව අතර පිළිවෙල රැකීම අනිවාර්යය වන අතර ම අවයවයකින් අනෙක් අවයවය වෙත මාරුවන විට ප්රමාද නොකර ඒ අතර අඛණ්ඩතාවය රැකීම ද අනිවාර්යය වේ.

24

මුහුණ සෝදා අවසන් කළ පසු ව අත් දෙක සේදීමට අපි යොමු වෙමු.

25

අත් දෙක සේදීමේ අනිවාර්යය සීමාව වනුයේ: ඇඟිලි තුඩුවල සිට වැළමිට දක්වා වැළමිට දෙක ඇතුළු සීමාවයි.

26

දකුණතෙහි ඇඟිලි තුඩු සෝදමින් ආරම්භ කරමු. අත් දෙක එකිනෙකට අමුණමින් ඇඟිලි අතර හොඳින් සෝදමු. පසු ව ජලය වැළමිට දක්වා ගෙන යමු.

අනුක්රමය

පසු ව වමත වෙත මාරු වී අතෙහි ඇඟිලි අමුණා ඒ අතර හොඳින් සෝදා එය ද වැළමිට දක්වා ගෙන යමු.

28

හිසට ජලය පිරිමැදීමට යොමු වෙමු. නව ජල වාරයකින් අත් දෙක තෙමා පසු ව තෙත්වූ අත් දෙක හිසෙහි ඉදිරිපස

තබා ඒ දෙක හිසෙහි පිටුපස දක්වා ගෙන යමු. පසු ව අපි ඒ දෙක එය ආරම්භ කළ තැනටම නැවත ගෙන එමු. හිස යන නිර්වචනය තුළ මුඩු හිසක් ඇති හා හිසකෙස් සහිත අය අතර වෙනසක් නැත.

29

හිස පිරිමැද ඉතිරි වූ ජලයෙන් කන්දෙක පිරිමදිමු. එය එක්වරක් පමණක් සිදු කරමු.

30

කන්දෙක පිරිමැදීමේ ක්රමය වනුයේ දබරැඟිලි කන් පෙති ඇතුළතෙහි ඇතුලු කොට ඒ දෙක පිරිමදිමින් කන්දෙක මතුපිට මහපොටැඟිල්ලෙන් පිරිමැදීමයි. ඒ අනුව කන් දෙක මතුපිටින් මෙන්ම ඇතුළතින්ද සෝදා දැමීමට අපට හැකි වේ.

31

පසු ව දෙපා සේදීමට යොමු වෙමු. දෙපා සේදීමේ දී අනිවාර්යය සීමා ව වනුයේ: දෙපා ඇඟිලි තුඩු සිට වළලු කර දක්වා වූ සීමාවයි. විළුඹු දෙක සේදීම ද අනිවාර්යය වේ.

32

වම් පාදයෙන් ආරම්භ කරමු. පාදයේ ඇඟිලි අතර හොඳින් සෝදමු. විළුඹු දෙක හා දෙපා මතුපිට සේදීම ගැන විපරමින් සිටිමු.

33

පසු ව දකුණු පාදය අප සෝදා හැරියාක් මෙන් වම් පාදය ද සෝදමු. එහි ද ඇඟිලි අතර හොඳින් සේදීම අප අමතක නොකළ යුතුය. විළුඹ සම්පූර්ණයෙන් සේදීමට හා දෙපා ජලය ආවරණය වන පරිදි සේදීමට වගබලාගත යුතුය.

34

أشْهَدُ أنْ لا إلهَ إلَّا اللهُ وَحْدَهُ لا شَرِيكَ لَهُ، وأشهدُ أنَّ مُحَمَّدًا عَبْدُهُ وَرَسُولُهُ

'අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු වඅෂ්හදු අන්න

මුහම්මදන් අබ්දුහු වරසූලුහු.’ (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවත් ඔහු ඒකීය බවත් ඔහුට කිසිදු හවුල් කරුවකු නොමැති බවත් මම සාක්ෂි දරමි. තවත සැබැවින්ම මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ඔහුගේ ගැත්තා බවත් ඔහුගේ ධර්ම දූතයාණන් බවත් මම සාක්ෂි දරමි.)

35

වුළු ධෝවනය අවසන් වූ පසු (දික්ර්) මෙනෙහි කිරීම් (දුආ) ප්රාර්ථනාවන් නබි පිළිවෙතක් බවට පත් කර ඇත. එමෙන්ම පහත සඳහන් ප්රාර්ථනාව ඊට අමතර ව පැවසීම ද නබි පිළිවෙතක් බවට පත් කර ඇත.

36

اللَّهُمَّ اجْعَلْنِي مِنَ التَّوَّابِينَ، واجْعَلْني مِنَ المُتَطَهِّرِينَ.

‘අල්ලාහුම්ම-ජ්අල්නී මිනත්-තව්වාබීන ව-ජ්අල්නී මිනල්-මුතතහ්හිරීන)

(යා අල්ලාහ් පාපක්ෂමාවේ නිරතවන්නන් අතරට මා පත් කරනු

මැනව! එමෙන්ම පිරිසිදු ව සිටින්නන් අතරට ද මා පත් කරනු මැනව!)

37

එසේ නැතහොත්

سُبْحانَكَ اللَّهُمَّ وبِحَمْدِكَ، أشْهَدُ أنْ لا إلهَ إلاَّ أنْتَ، أسْتَغْفِرُكَ وأتُوبُ إِلَيْكَ

‘සුබ්හානකල්ලාහුම්ම වබිහම්දික අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලා අන්ත අස්තග්ෆිරුක වඅතූබු ඉලයික.’
(යා අල්ලාහ් ඔබගේ ප්රශංසාව තුළින් ඔබ සුවිශුද්ධ විය. ඔබ හැර නැමදුමට කිසිවකු නොමැති බව මම සාක්ෂි දරමි. මම ඔබෙන් පව් සමාව අයැදිමි. තවද ඔබ වෙත පසුතැවිලි වී හැරෙමි.)

27 අනුක්රමය

නිරය මත සඳහන් කරනු ලැබ ඇති වදන්

1

මා වුළු -ධෝවනය- කළ යුත්තේ කෙසේ ද?

2

{يَا أَيُّهَا الَّذِينَ آمَنُوا إِذَا قُمْتُمْ إِلَى الصَّلَاةِ فَاغْسِلُوا وُجُوهَكُمْ وَأَيْدِيَكُمْ إِلَى الْمَرَافِقِ وَامْسَحُوا بِرُءُوسِكُمْ وَأَرْجُلَكُمْ إِلَى الْكَعْبَيْنِ}

අහෝ විශ්වාස කළවුනි ! නුඹලා සලාතයට සූදානම් වූ විට නුඹලාගේ මුහුණු ද නුඹලාගේ අත් මැණික් කටුව දක්වා ද සෝදා ගනු. තවද නුඹලාගේ හිස් (ජලයෙන්) පිරිමදිනු. තවද නුඹලාගේ පාද ද වළලු කර දක්වා සෝදා ගනු.

(සූරා අල් මාඉදා:6)

3

දෙඅත්ල සේදීම

4

කට කලත්වා සේදීම හා නාසය පිරිසිදු කර සේදීම

5

දිගටම කිරීම

6

වෙන් කිරීම

7

මුහුණ සේදීම

8

වඩාත් උචිත

9

දෙවැන්න

10

'නීය්යත්' හෙවත් චේතනාව ගෙන ඒම හා 'බිස්මිල්ලාහ්' යැයි අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කිරීම.

11

දෙඅත් සේදීම

12

කට කලත්වා සේදීම

13

නාසය සේදීම

14

මුහුණ සේදීම

15

මැණික් කටුව ඇතුළු ව අත් දෙක සේදීම.

16

ජලයෙ◌් හිස පිරිමැදීම හා කන් දෙක පිරිමැදීම.

17

වළලු කර ඇතුළු ව දෙපා සේදීම.

18

අත් දෙක සේදීම

19

ජලයෙන් හිස පිරිමැදීම

20

හිසෙහි ආරම්භය වනාහි : නළලෙහි කෙළවර සහ පොදුවේ හිසකෙස් වැවන ස්ථානයෙ◌් ආරම්භය යි.

21

හිසෙහි අවසානය: පිටුපසින් හිසකෙස් වැවන ස්ථානයෙ◌් අවසානයයි.

22

කන් දෙක ජලයෙන් පිරිමැදීම

23

දෙපා සේදීම

24

නබි තුමාණෝ (එතුමා කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදා වේවා!) මෙසේ පැවසූහ.

«ويلٌ للأعقابِ منَ النَّار، أسبِغُوا الوضوء».

"විළුඹුවලට විනාශයක්ම වනු ඇත. නුඹලා වුළු ධෝවනය සම්පූර්ණ කරනු."

ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත.

25

«أشْهَدُ أنْ لا إلهَ إِلَّا اللهُ وَحْدَهُ لا شَرِيكَ لَهُ، وأشهدُ أَنَّ مُحَمَّدًا عَبْدُهُ وَرَسُولُهُ».

'අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහූ ලා ෂරීක ලහූ වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහූ වරසූලුහූ.' (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවත් ඔහු ඒකීය බවත් ඔහුට කිසිදු හවුල් කරුවකු නොමැති බවත් මා සාක්ෂි දරමි. තවත සැබැවින්ම මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා

ඔහුගේ ගැත්තා බවත් ඔහුගේ ධර්ම දූතයාණන් බවත් මා සාක්ෂි දරමි.)

මෙය ඉමාම් මුස්ලිම් විසින් දන්වා ඇත.

26

«اللَّهُمَّ اجْعَلْنِي مِنَ التَوَّابِينَ، واجْعَلْني مِنَ المُتَطَهِّرِينَ».

'අල්ලාහුම්ම-ජ්අල්නී මිනත්-තව්වාබීන ව-ජ්අල්නී මිනල්-මුතතහ්හිරීන)

(යා අල්ලාහ් පාපක්ෂමාවේ නිරතවන්නන් අතරට මා පත් කරනු මැනව! එමෙන්ම පිරිසිදු ව සිටින්නන් අතරට ද මා පත් කරනු මැනව!)

ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත.

27

«سُبْحانَكَ اللَّهُمَّ وبِحَمْدِكَ، أشْهَدُ أنْ لا إلهَ إلَّا أنتَ، أسْتَغْفِرُكَ وأتُوبُ إلَيكَ».

'සුබ්හානකල්ලාහුම්ම වබිහම්දික අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලා අන්ත අස්තග්ෆිරුක වඅතූබු ඉලයික.'

(යා අල්ලාහ් ඔබගේ ප්‍රශංසාව තුළින් ඔබ සුවිශුද්ධ විය. ඔබ හැර නැමදුමට කිසිවකු නොමැති බව මම සාක්ෂි දරමි.

මම ඔබෙන් පව් සමාව අයැදිමි. තවද ඔබ වෙත පසුතැවිලි වී හැරෙමි.)

'දහවල් හා රාත්රියේ ක්රියාදාම' යන කෘතියෙහි නසාර් තුමා මෙය වාර්තා කර ඇත.

මා සලාතය ඉටු කළ යුත්තේ කෙසේ ද?

'තක්බීර්' හෙවත් අල්ලාහු අක්බර් (යැයි තක්බීර් තහ්රීමා) උසිරීමේ සිට - අත් තස්ලීම්' හෙවත් -අස්සලාමු අලයිකුම්- (යනුවෙන් පවසා සලාතය සම්පූර්ණ කිරීම) දක්වා

මීම්

හඬ

1

'ඉකාමත්' -සලාතය සඳහා සූදානම් වීමේ- ඇරයුමෙහි හඬ.

2

'ඉකාමත්'-සලාතය සඳහා සූදානම් වීමේ- ඇරයුමෙහි හඬ විකාශය වෙමින් පවතී.

චේතනාව මනසෙහි පිහිටුවා ගැනීම, සලාතය ඉටු කරන්නා විසින් සිදු කරන පළමු කටයුත්ත වේ. චේතනාව තබා ගත යුතු ස්ථානය හදවතයි.

3

අපි කිබ්ලාවට මුහුණ ලා සිටිමු. ඉමාම් හෙවත් සලාතය මෙහෙයවන්නෙකු හෝ තනි කෙනෙකු ලෙස හෝ ඔබ සිටින්නෙහි නම් ඔබ ඉදිරියේ (ඒ හරහා යා නොහැකි) බාධකයක් තබා ගන්න.

4

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයාණන් ය.

ආරම්භක තක්බීරය. එමගින් අපි සලාතයට ප්‍රවේශ වෙමු. එය දිවෙන් උච්චාරණය කර පැවසීම අවශ්‍ය වන්නේය.

5

තක්බීර් පවසන අවස්ථාවේ අපගේ දෑත් උරහිස මට්ටමට පිහිටන සේ

ඔසවමු. අපගේ ඇඟිලිවල ඇතුලු පැත්ත (අල්ල) කිබ්ලා දෙසට හරවමු.

එසේ නැතහොත්

ඒ අයුරින්ම කන්දෙක මට්ටම දක්වා ඒදෙක ඔසවමු.

6

තක්බීරයෙන් පසු පපුව මත හෝ පපුවට පහළින් පෙකනියට ඉහළින් හෝ පෙකනියට පහළින් හෝ තබමු. ඒ සියලුම ක්‍රම නිවැරදිය.

අපගේ දකුණත වම් අත්ල මත පිටතින් තබමු.

එසේ නැතහොත් දකුණු අත්ල වම් අත්ල මතුපිට මත තබා බැද ගනිමු.

එසේත් නැතහොත් දකුණු අතින් වම් බාහුව මත බැද ගනිමු.

7

අල්ලාහුම්ම බාඉද් බයිනී වබයින (ක)හතායාය කමා බාඅද්ත බයිනල් මෂ්රිකි වල් මග්රිබි අල්ලාහුම්ම නක්කිනී

මින් (ක)හතායාය කමා යුනක්කස් සව්බුල් අබ්යලූ මිනද් දනස්. අල්ලාහුම්මග්සිල්නී මින් (ක)හතායාය බිල් මාඉ වස්සල්ජි වල් බරද්.

තේරුම: යා අල්ලාහ්! ඔබ බටහිර හා නැගෙනහිර දුරස් කලාක් මෙන් මා අතර හා මාගේ පාපයන් අතර දුරස් කරන්වා! අහෝ අල්ලාහ්! සුදු ඇඳුමින් කුණු ඉවත් කරන්නාක් මෙන් මාගේ පාපයන්ගෙන් ද මා පිරිසිදු කරන්වා! අහෝ අල්ලාහ්! පිනිකැට වලින් සිසිලෙන් හා ජලයෙන් මාගේ පාපයන් මගෙන් සෝ්දා හරින්වා!

ඉහ්රාම් හෙවත් ආරම්භක තක්බීරයෙන් පසු අල් කුර්ආනය පාරායනයට පෙර දුආඋල් ඉස්තිෆ්තාහ් හෙවත් ආරම්භක ප්රාර්ථනාව උසුරමු. සලාතයේ ආරම්භක ප්රාර්ථනාව සඳහා ප්රාර්ථනා කිහිපයක්ම පැමිණ ඇත. නබි මග වනුයේ ඒවා අතර විවිධාංගීකරණය කිරීමය.

8

‘අඋඃදු බිල්ලාහි මිනෂ් ෂෙයිතානිර් රජීම්’ -පළවා හරින ලද ෂයිතාන්ගෙන් ආරක්ෂාව අල්ලාහ්ගෙන් පතමි.-

අරාම්භක ප්රාර්ථනාවට පරව ඉස්තිආදා -අවුදු...- පවසා පසු ව අල් ෆාතිහා පරිච්ඡේදය පාරායනය කිරීම.

9

බැගෑපත් හා තැන්පත්භාවයෙන් යුතු ව වාක්යයක් වාක්යක් බැගින් පාරායනය කරමු.

10

ආමීන්... (පිළිගනු මැනව!)

සලාතය ඉටු කරන්නා ‘ඉමාම්’ (මෙහෙයවන්නා) වුව ද ‘මඃමූම්’ (අනුගමනය කරන්නා) වුව ද තනි ව ඉටු කරන්නෙකු වුව ද ඔහුට මෙම ප්රකාශය සුන්නාවක් හෙවත් නබි පිළිවෙතක් වන්නේය. එය ෆාතිහාවෙන් වූ වාක්යයක් නොවේ. සැබවින්ම එය ‘අහෝ දෙවියනි!

පිළිතුරු දෙනු මැනව!’ යන අර්ථයෙන් යුත් ප්රාර්ථනාවකි.

11

ෆාතිහාවෙන් පසු අල් කුර්ආනයෙන් පහසු කොටසක් පාරායනය කරමු. එය පූර්ණ පරිච්ඡේදයක් විය හැක. එසේත් නැතිනම් ඉන් කොටසක් විය හැක. පාරායනය කොට අවසන් කළ පසු ව රුකූඃ ඉරියව්වට යොමු වීමට පෙර සුළු වේලාවක් නිහඬව රැඳී සිටිමු.

12

‘අල්ලාහු අක්බර්’ (අල්ලාහ් අති ශ්රේෂ්ඨයාණන්ය)

කියාම් හෙවත් සිටගත් ඉරියව්වෙන් රුකූඃ හෙවත් ඉරියව්වට මාරු වීමේ තක්බීරය පවසමු.

නබි (සල්) තුමාණන් සලාතය තුළ දෙඅත් ඔසවූ දෙවන ස්ථානය මෙයයි. ඒ අනුව උරහිස් දෙක හෝ කන් දෙක

මට්ටමට අපගේ අත් අපි ඔසවීම නබි පිළිවෙතක් වේ.

13

අපගේ දෙ අත්ල දණහිස් දෙක මත තබමු. අපගේ ඇඟිලි විහිදුවා දණහිස් දෙක අල්ලා ගන්නා පරිදි එයට ඉතා සමීපව තබා ගත යුතුයි.

අපගේ රුකූඃ ඉරියව්වෙහි මදක් රැඳී සිටිමු. අත්දෙක පපු පෙදසින් දුරස්ව තබමු. අපගේ පැති දෙකින් එක් පැත්තකට ඇලවී කම්මුලෙහි මතුපිට හෙළී නොකරමු.

14

පිට වක්රාකාර නොවන පරිදි තිරස්ව ද හිස පිට සමග ඍජුව ද පිහිටිය යුතුය. එය අපි උස් හෝ පහත් නොකරමු.

15

'සුබ්හාන රබ්බියල් අළීම්' (මාගේ උත්තරීතර පරිමාධිපති සුවිශුද්ධය)

මෙම තස්බීහ් ගායනාව තුන්වරක් උසුරමු. එය පූර්ණත්වයේ අවම ප්‍රමාණයයි. එක් තස්බීහයක් ප්‍රමාණවත් වේ. අප කැමතිනම් අධික කරමු. තස්බීහ් පැවසීමෙහි සඳහන්ව ඇති තස්බීහයන් විවිධාංගීකරණය කොට භාවිත කරමු.

16

රුකූඃ ඉරියව්වෙහි පවසනු ලබන තස්බීහ් ගායනාවන් බොහෝමයකි.

17

'සමිඅල්ලාහු ලිමන් හමිදා' (අල්ලාහ් තමන් පැසසූ අයට සවන් දුනි.)

අප වෙන් වෙන්ව සලාතය ඉටු කරමින් සිටිය ද අප අතරින් කෙනෙකු ඉමාම්වරයකු ලෙස සිටිය ද රුකූඃ ඉරියව්වෙන් නැගිටින විට අපි මෙය පවසමු.

18

උරහිස් දෙක හෝ කන් දෙක මට්ටමට අපගේ අත් අපි ඔසවමු. අත්දෙක ඔසවන තුන්වන ස්ථානය මෙයයි.

19

පසු ව (පහත සඳහන් පරිදි) පවසමින් ඍජු ව සමාන්තර ව සිට ගනිමු.

'රබ්බනා වලකල් හම්දු' (අපගේ පරමාධිපතියාණෙනි! සියලු ප්‍රසංශා ඔබටමය.)

20

රුකූඃ ඉරියව්වෙන් නැගිටීමෙන් පසු අපගේ දෙ අත් පහළ හෙළීමට හෝ ඒ දෙක බැඳ තබා ගැනීමට හෝ අපට පුළුවන.

21

රුකූඃ ඉරියව්වෙන් පසු නැගිට සිටීමේ ඉරියව්ව දිගු කිරීමත් එහි රැඳී සිටීමත් නබි පිළිවෙතක් වේ.

22

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයාණන් යැයි පවසමින්

කියාම් නොහොත් සිට ගැනීමේ ඉරියව්වේ සිට සුජූද් ඉරියව්ව වෙත මාරුවීමේ තක්බීරය පවසමින් පොළොව දෙසට නැවෙමු.

දණහිස් දෙකට පෙර අත් දෙක හෝ අත් දෙකට පෙර දණහිස් දෙක හෝ එම ක්‍රම දෙකින් අපට පහසු ක්‍රමය ඉදිරියට තබමු.

23

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) අපට ඉගැන් වූ පරිදි අවයව හතක් මත අප සුජූද් කිරීම අනිවාර්යය වේ.

නළල සමග නාසය, දෙ අත්ල, දෙපා, දෙ දණහිස්.

24

දෙපා ඇඟිලි තුඩු කිබ්ලා දිසාවට තබා දෙපා සිටවා තබමු.

කලවා දෙක අතර හිඩැස් තබමු. ඒ දෙකින් උදරය ඔසවා තබමු.

සාමූහික ව අප සලාතය ඉටු කරන විට දී අප අවට සිටින්නන්හට කරදරයක් ඇති නොවන තාක් කල් දෑත් බාහු පොළොවෙන් ඔසවා ද ඇලපතින් ඒ දෙක දුරස් කර ද තබමු.

උරහිස් මට්ටමට හෝ කන් දෙක මට්ටමට හෝ අත් දෙක තබමු.

25

'සුබ්හාන රබ්බියල් අඃලා' (මාගේ උත්තරීතර පරිමාධිපති සුවිශුද්ධය.)

මෙම තස්බීහ් ගායනාව තුන්වරක් උසුරමු. එය පූර්ණත්වයේ අවම ප්‍රමාණයයි. එක් තස්බීහයක් ප්‍රමාණවත් වේ. අප කැමතිනම් අධික කරමු. තස්බීහ් පැවසීමෙහි සඳහන්ව ඇති තස්බීහයන් විවිධාංගීකරණය කොට භාවිත කරමු. මෙලොව හා

මතුලොව යහපත් දැයින් අපට ප්‍රියමනාප දෑ ප්‍රාර්ථනා කර සිටිමු.

26

අල්ලාහ්ගේ දූතයාණෝ (එතුමා කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදා වේවා) මෙසේ පැවසූහ. “ගැත්තා තම පරමාධිපතිට වඩා සමීපයෙන් සිටිනුයේ ඔහු සුජූද් කරන්නෙකු ලෙස සිටින විටදීය. එහෙයින් (සුජූද් හි) නුඹලා අධික ලෙස ප්‍රාර්ථනා කරන්න.”

27

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයාණන් යැයි පැවසීම.

තක්බීර් පවසන්නන් ලෙස අපි අපගේ හිස සුජූද් ඉරියව්වෙන් ඔසවමු.

වම් කකුල හකුළා ඒ මත තැන්පත්ව වාඩිවෙමු. දකුණු පාදය සිටවා තබමු. එහි ඇඟිලි තුඩු කිබ්ලා දෙසට මුහුණලා තබමු.

එසේ නැතහොත්

පාද දෙකම හිටවා ඒ දෙකෙහි (විලුඹ) පසු පැතිවල වාඩිවෙමු.

අපගේ බාහු, දකුණු බාහු ව දකුණු කලවා මත ද වම් බාහු ව වම් කලවා මත ද අතුරා අත්ල දණහිස ළඟ හෝ දණහිස මත පිහිටන සේ තබමු.

28

‘රබ්බි-ග්ෆිර්ලී’ (මාගේ පරමාධිපතියාණෙනි, මට සමාව දෙනු මැනව!)

පහසුවෙන් වාඩි වී සජදා දෙක අතර එමගින් ප්රාර්ථනා කරමු.

29

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්රේෂ්ඨයාණන් යැයි පැවසීම.

තක්බීර් පවසමින් දෙවන සජදා ව වෙත අපි නැවෙමු. එය ස්වරූපයෙහි හා පවසනු ලබන දෑහි පළමුවන සජදාව මෙන්මය.

30

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්රේෂ්ඨයාණන් යැයි පැවසීම.

පළමු රකආතයේ අප ඉටු කළ පරිදිම දෙවන රකආතය ද ඉටු කරමු.

දෑත් තැබීම, ෆාතිහා පරිච්ඡේදය හා අල් කුර්ආනයෙන් වාක්යයක් හෝ වාක්ය කිහිපයක් පාරායනය කිරීම යනාදිය සිදු කර...

පසු ව රුකූඃ කරමු.

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්රේෂ්ඨයාණන් යැයි පැවසීම.

නැගී සිට ගනිමු.

'සමිඅල්ලාහු ලිමන් හමිදා' (අල්ලාහ් තමන් පැසසූ අයට සවන් දුනි.)

පසු ව සජදා සඳහා යොමු වෙමු.

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්රේෂ්ඨයාණන් යැයි පැවසීම.

සජදා දෙකක් ඉටු කරමු. පසු ව තෂහ්හුද් සඳහා වාඩිවෙමු.

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයාණන් යැයි පැවසීම.

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයාණන් යැයි පැවසීම.

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයාණන් යැයි පැවසීම.

31

දෙවන රක්අාතය අවසන් කළ පසු ව තෂහ්හුද් සඳහා වාඩි විය යුතු වේ. වම් කකුල මත තැන්පත්ව දකුණු කකුල සිටවා තබා පාදැඟිලි තුඩු කිබ්ලා දෙසට මුහුණලා වාඩි වෙමු.

32

ඉෆ්තිරාෂ් ඉඳුම (වම් කකුල මත තැන්පත්ව දකුණු කකුල සිටවා තබා පාදැඟිලි තුඩු කිබ්ලා දෙසට මුහුණලා වාඩි වීම.) සුබ්හු, ජුමුආ, දෙඅවුරුදු සලාත් වැනි ද්විත්ව රක්අාත් සහිත සලාත්වල තෂහ්හුද්හි පිහිටිය යුතු අතර ම රක්අාත් තුනකින් සහ හතරකින් සමන්විත

සලාත්වල පළමු තෂහ්හුද්හි හා සජදා දෙකක් අතර වාඩිවීමෙහි ද පිහිටිය යුතුයි.

33

කිසිවකුගේ ශරීරයේ තරබාරුකම හේතුවෙන් හෝ ඔහුගේ දෙපාහි ඇති වේදනාවක් හේතුවෙන් හෝ ඒ හැර වෙනත් හේතුවකින් හෝ ඉෆ්තිරාෂ් ක්‍රමයට (වම් කකුල මත තැන්පත්ව දකුණු කකුල සිටවා තබා පාදැගිලි තුඩු කිබ්ලා දෙසට මුහුණලා වාඩි වීම) වාඩි වීමට නොහැකි අයහට වාඩි වීමට හැකි කවර ක්‍රමයකින් හෝ වාඩිවීම වරදක් වන්නේ නැත.

34

තෂහ්හුද් හි දබරැගිල්ල හැර සෙසු සියලු ඇඟිලි මොලවාගෙන දකුණත දකුණු කලවා මත තබමු. එමගින් අපි සංඥා කරමු.

35

නැතහොත් මහටපටැගිල්ල මැදගිල්ල සමග චක්රාකාර ලෙස තබමු. දබරැගිල්ලෙන් සංඥා කරමු.

36

වම් අත වනාහි, එය අතුරා වම් කලවා මත තැබිය හැක. එසේ නැතහොත් එය හකුළා දණහිස මත තැබිය හැක.

තෂහ්හුද්හි අපගේ බැල්ම දකුණතෙහි දබරැඟිල්ල දෙසට යොමු වී තිබීම සතුටුදායකය.

37

අත්තහය්යාතු ලිල්ලාහි වස්සලවාතු වත්තය්යිබාතු අස්සලාමු අලයික අය්යුහන් නබිය්යු වරහ්මතුල්ලාහි වබරකාතුහු අස්සලාමු අලයිනා වඅලා ඉබාදිල්ලාහිස් සාලිහීන් අෂ්හදු අන්ලාඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු.

තේරුම: සියලු ශුභාසිංසනයන් අල්ලාහ් සතුය. එමෙන්ම සියලු

ආශිර්වාදයන් හා සියලු යහපත් දෑද (ඔහු සතුය). අහෝ නබි තුමණි! ඔබට අල්ලාහ්ගේ දයාව හා ඔහුගේ අභිවෘද්ධිය හිමි වේවා! එමෙන්ම අප වෙත හා අල්ලාහ්ගේ දැහැමි ගැත්තන් වෙත ද අල්ලාහ්ගේ දයාව හිමි වේවා! නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවිදෙකු නොමැති බවට මම සාක්ෂි දරමි. එමෙන්ම නියත වශයෙන්ම මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔහුගේ ගැත්තා හා ඔහුගේ ධර්ම දූතයා බවට ද මම සාක්ෂි දරමි.

පළමු තෂහ්හුදය කියවමු. එය සලාතය රකආත් තුනකින් හෝ හතරකින් වූ විට පමණි.

සලාතය සුබ්හු හෝ ජුමුආ හෝ දෙඅවුරුදු සලාතයන් මෙන් රකආත් දෙකකින් සමන්විත වී නම් එවිට ඉබ්රාහීමීය්යා සලවාතය කියවමින් අපි තෂහ්හුදය පූර්ණවත් කරමු.

'අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා සල්ලයිත් අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්, අල්ලාහුම්ම බාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්'

තේරුම: දෙවියනි, ඔබ ඉබ්රාහීම් හා එතුමාගේ පවුලේ උදවිය ප්‍රශංසාවට ලක් කළා සේ මුහම්මද් හා එතුමාගේ පවුලේ උදවිය ප්‍රශංසාවට ලක් කරනු මැනව! සැබැවින් ම ඔබ ප්‍රශංසනීය හා කීර්තිමත් ය. තව ද ඔබ ඉබ්රාහීම්ට හා එතුමාගේ පවුලේ උදවියට අභිවෘද්ධිය ඇති කළා සේ මුහම්මද්ට හා එතුමාගේ පවුලේ උදවියට අභිවෘද්ධිය ඇති කරනු මැනව! සැබිවින් ම ඔබ ප්‍රශංසනීය හා කීර්තිමත් ය.

38

‘අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලා’ ඔබට ශාන්තිය ද අල්ලාහ්ගේ කරුණාව ද ලැබේවා!

‘අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලා’ ඔබට ශාන්තිය ද අල්ලාහ්ගේ කරුණාව ද ලැබේවා!

තෂහ්හුදය හා නබි පිළිවෙත තුළ සඳහන්ව ඇති ප්‍රාර්ථනාවන් කියවා අවසන් කිරීමෙන් පසු සලාමය ගෙන ඒම. නමුත් මෙය රකආත් දෙකෙහි සලාතයෙහි වන්නකි.

39

අල්ලාහු අක්බර් යැයි සැහැල්ලුවෙන් සවන් වැකෙන්නට සලස්වමු.

සලාතය මග්රිබ් මෙන් රකආත් තුනකින් සමන්විත සලාතයක් වී නම් හෝ ලුහර්, අසර් හා ඉෂා සලාතයන් මෙන් රකආත් හතරකින් සමන්විත සලාත් වී නම්,

40

අප මග්රිබ් සලාතය ඉටු කරමින් සිටින විට රකඅතයක් ඉටු කිරීම සඳහාද ලුහර් අසර් හා ඉෂා සලාත ඉටු කරමින් සිටින විට රකආත් දෙකක් ඉටු කිරීම සඳහාද පළමු තෂහ්හුදයෙන් පසු ව අපි නැගිට සිටිමු. එහි සූරතුල් ෆාතිහාව කියවා රුකූඃ, සුජූද් කියාම් ජුලූස් යන ඉරියව්වන්හි පෙර පැහැදිලි කළ සියල්ල ගෙනැවිත් ඉටු කරමු.

41

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්රේෂ්ඨයාණන් යැයි පැවසීම.

42

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා තෂහ්හුද් දෙකක් සහිත සෑම සලාතයකදීම අවසන් තෂහ්හුද්හි තවර්රුක් ඉඳුමෙන් වාඩි වන්නෙකු ලෙස සිටියහ.

43

රකආත් තුනකින් හා හතරකින් සමන්විත සලාත්වල පමණක් අවසන් තෂහ්හුද්හි තවර්රුක් ඉදුම පිහිටනු ඇත. එයට විද්‍යුහයන් බොහෝමයක් ඇත.

44

වම් කකුල අතුරා දකුණු කකුල සිටුවා ඒ දෙකම දකුණු පැත්තෙන් බැහැරට ගෙන අල්ලාහ්ගේ දයාවදෙක පොළොව මත තබා වාඩිවීම.

එසේ නැතහොත්

පාද දෙකම අතුරා ඒ දෙකම දකුණු පැත්තෙන් බැහැරට ගෙන වාඩිවීම.

එසේ නැතහොත්

දකුණු කකුල අතුරා වම් කුකල කලවා අතර හා දකුණු කෙණ්ඩය අතර ඇතුල් කොට වාඩිවීම.

45

අවසන් තෂහ්හුද් ඉදුමෙහි අපි තෂහ්හුදය කියවමු. පසු ව එයට පරව

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත සලවාත් පවසමු.

46

සලාම් පැවසීමට පෙර හා තෂහ්හුදය අවසන් කිරීමෙන් පසු ව කරුණු හතරක් සම්බන්ධයෙන් අපි අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතමු. අපා ගින්නේ දඬුවමින්, කබ්ර් හෙවත් මිනීවළෙහි වේදනාවෙන් ජීවිත්වීමේ හා මරණයේ පරීක්ෂණයෙන් හා මසීහුද් දජ්ජාල්ගේ අර්බුධයේ හානියෙන්...

මෙලොවට හා මතුලොවට යහපත් වන දැයින් අපි අභිමත කරන දෑ ප්රාර්ථනා කර සිටිමු.

47

‘අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලා’ ඔබට ශාන්තිය ද අල්ලාහ්ගේ කරුණාව ද ලැබේවා!

‘අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලා’ ඔබට ශාන්තිය ද අල්ලාහ්ගේ කරුණාව ද ලැබේවා!

සලාතය අවසන් වීම හෝ එයින් මිදීම සලාම් පැවසීමෙන් මිස සිදු නොවනු ඇත.

48

සලාම් පැවසීමෙන් අපගේ සලාතය අපි අවසන් කර ගනිමු.

අස්තග්ෆිරුල්ලාහ් (මම අල්ලාහ්ගෙන් සමාව අයදිමි.)... අස්තග්ෆිරුල්ලාහ්... අස්තග්ෆිරුල්ලාහ්...

49

සලාතය ඉටු කරන්නා සලාම් දුන් විට තුන් වරක් අල්ලාහ්ගෙන් සමාව අයැද සිටීම නබි පිළිවෙතකි. පසු ව අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කවර දික්රයන් කළ බවට වාර්තා වී ඇත්තේද ඒවා තුළින් අල්ලාහ් ව මෙනෙහි කරනු ඇත.

මීම්

තිරය මත ලියා ඇති වදන්

1

ඔබ මෙහෙයවන්නෙකු හෝ තනි ව ඉටු කරන්නෙකු වුව ද

2

ආරම්භක තක්බීරය පැවසීම.

3

උරහිස් දෙක මට්ටමට දෑත් ඔසවමු.

4

එසේ නැතහොත් ඒ අයුරින්ම කන්දෙක මට්ටම ඔසවමු.

5

දෑත් පපුව මත තබමු.

6

එසේ නැතහොත් පෙකනියට ඉහළින්

7

එසේ නැතහොත් පෙකනියට පහළින්

8

අපගේ දකුණත වම් අත්ල මත පිටතින් තබමු.

9

එසේත් නැතහොත් දකුණු අත වම් බාහු ව මත තබා බැද ගනිමු.

10

'දුආ අල් ඉස්තිෆ්තාහ්' නොහොත් ආරම්භක ප්රාර්ථනාව.

11

අල්ලාහුම්ම බාඉද් බයිනී වබයින (ක)හතායාය කමා බාඅද්ත බයිනල් මෂ්රිකි වල් මග්රිබි අල්ලාහුම්ම නක්කිනී මින් (ක)හතායාය කමා යුනක්කිස් සව්බුල් අබ්යලු මිනද් දනස්. අල්ලාහුම්මග්සිල්නී මින් (ක)හතායාය බිල් මාඉ වස්සල්ජි වල් බරද්. තේරුම: යා අල්ලාහ්! ඔබ බටහිර හා නැගෙනහිර දුරස් කලාක් මෙන් මා අතර හා මාගේ පාපයන් අතර දුරස් කරත්වා! අහෝ අල්ලාහ්! සුදු ඇඳුමින් කුණු ඉවත්

කරන්නාක් මෙන් මාගේ පාපයන්ගෙන් ද මා පිරිසිදු කරන්වා! අහෝ අල්ලාහ්! පිනිකැට වලින් සිසිලෙන් හා ජලයෙන් මාගේ පාපයන් මගෙන් සෝදා හරින්වා!

12

ඒවා අතර විවිධාංගීකරණය කිරීම සුන්නාවකි. (නබි පිළිවෙතකි)

13

ආරක්ෂාව පැතීම

14

'අඋඉදු බිල්ලාහි මිනෂ් ෂෛයිතානිර් රජීම්' පළවා හරින ලද ෂයිතාන්ගෙන් ආරක්ෂාව අල්ලාහ්ගෙන් පතමි.

15

අල් ෆාතිහාව (ආරම්භක පරිච්ඡේදය)

16

'බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්. අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන්. අර් රහ්මානිර් රහීම්. මාලිකි යව්මිද් දීන්. ඉය්යාක නඃබුදු වඉය්යාක නස්තඊන්.

ඉහ්දිනස් සිරාතල් මුස්තකීම්. සිරාතල්ලදීන අන්අම්ත අලයිහිම් ගය්රල් මග්ලූබි අලයිහිම් වලල් ළාල්ලීන්.'

මහත් දයා ගුණයෙන් යුක්ත කරුණාදායක අල්ලාහ් ගේ නාමයෙනි. සියලු ප්‍රශංසා ලෝකයන් හි පරමාධිපති වූ අල්ලාහ්ට ම ය. මහත් දයා ගුණයෙන් යුක්ත කරුණාදායක ය. විනිශ්චය දිනයේ රජු ය. ඔබව ම අපි නමදිමු. ඔබගෙන් ම අපි උදව් පතමු. අප ට ඍජු මඟ පෙන්වනු මැනව. ඔබ කවරෙකු ට ආශිර්වාද කළේ ද එම මාර්ගයයි. තමන් කෙරෙහි කෝපය ට ලක් වූවන් හෝ මුළාවූවන් ගේ මාර්ගය නොව. මෙය පිළිගනු මැනව!

17

'ආමීන්'

18

'දෙවියනි! මෙය පිළිගනු මැනව' යන අර්ථයෙන් ප්‍රාර්ථනාව යෙදී ඇත.

19

අල් කුර්ආනයෙන් පහසු කොටසක් අපි කියවමු.

20

රුකූඋ කිරීමේ ඉරියව්ව

21

'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයාණන් ය.

22

පිට වක්‍රාකාර නොවන පරිදි තිරස් ව පිහිටිය යුතුයි.

23

රුකූඋවෙහි සුබ්හාන රබ්බියල් අළීම් යනුවෙන් ද

24

හදීස්වල සඳහන් ව ඇති පරිදි රුකූහි මෙනෙහි කිරීම් අතරින් සමහරක්.

25

'සුබ්බූහුන් කුද්දූසුන් රබ්බුල් මලාඉකති වර් රූහ්' ඔහු අති පිවිතුරුය. සුවි ශුද්ධය.

දේව දූතයින් හා ආත්මාවෙහි (ජිබ්රීල්ගේ) පරමාධිපතිය.

26

'සුබ්හානක රබ්බනා වබිහම්දික අල්ලාහුම්මග්-ෆිර් ලී.' අපගේ පරමාධිපතියාණෙනි! ඔබේ ප්රශංසාව තුළින් ඔබ සුවිශුද්ධය. අහෝ දෙවියනි! මට සමාව දෙනු මැනව!

27

'සමිඅල්ලාහු ලිමන් හමිදා' අල්ලාහ් තමන් පැසසූ අයට සවන් දුනි.

28

'රබ්බනා වලකල් හම්දු, හම්දන් කසීරන් තයියිබන් මුබාරකන් ෆීහි' අපගේ පරමාධිපතියාණෙනි! සමෘද්ධිමත් යහපත් අධික ප්රශංසාවෙන් යුත් සියලු ප්රශංසා ඔබටමය.

29

අපගේ දෑත් පහළට එල්ලෙන්නට හරිමු.

30

එසේ නැතහොත් ඒ දෙක බැඳ තබා ගනිමු

31

සුජූද් ඉරියව්ව

32

නාසය සමග නළල

33

අත්ල දෙක

34

දණහිස් දෙක

35

පාද දෙක

36

'සුබ්හාන රබ්බියල් අඃලා' මාගේ උත්තරීතර පරිමාධිපති සුවිශුද්ධය.

37

“ගැත්තා තම පරමාධිපතිට වඩා සමීපයෙන් සිටිනුයේ ඔහු සුජූද් කරන්නෙකු ලෙස සිටින විටදීය. එහෙයින් නුඹලා අධික ලෙස එහි ප්රාර්ථනා කරන්න.” ඉමාම් මුස්ලිම් විසින් මෙය වාර්තා කර ඇත.

38

ඉෆ්තිරාෂ් ඉදුම

39

ඉක්ආ ඉදුම

40

රබ්බිග්ෆිර්ලී (තුන්වරක්) අහෝ මාගේ පරමාධිපතියාණෙනි, මට සමාව දෙනු මැනව!

41

‘අල්ලාහුම්මග් ෆිර්ලී වර්හම්නී වජ්බුර්නී වහ්දිනී වර්සුක්නී’ දෙවියනි! මට සමාව දෙනු මැනව! මට කරුණා කරනු මැනව! මගේ අඩුපාඩු නිවැරදි කරනු

මැනව! මට යහමග පෙන්වනු මැනව. මට පෝෂණය කරනු මැනව!

42

අස්-සුබුහු (අළුයම සලාතය)

43

අල් ජුමුආ (සිකුරාදා සලාතය)

44

අල් ඊදයින් (දෙඅවුරුදු සලාතය)

45

ළුහර් (හිරු මුදුණින් අවරට යාමත් සමග වූ සලාතය)

46

අසර් (සවස සලාතය)

47

මග්රිබ් (හිරු අවරට යාමත් සමග වූ සලාතය)

48

ඉෂා (රාත්රී සලාතය)

49

අත්තහය්යාතු ලිල්ලාහි වස්සලවාතු වත්තය්යිබාතු අස්සලාමු අලයික අය්යුහන් නබිය්යු වරහ්මතුල්ලාහි වබරකාතුහු අස්සලාමු අලයිනා වඅලා ඉබාදිල්ලාහිස් සාලිහීන් අෂ්හදු අන්ලාඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු.

තේරුම: සියලු ශුභාසිංසනයන් අල්ලාහ් සතුය. එමෙන්ම සියලු ආශිර්වාදයන් හා සියලු යහපත් දෑද (ඔහු සතුය). අහෝ නබි තුමණී! ඔබට අල්ලාහ්ගේ දයාව හා ඔහුගේ අභිවෘද්ධිය හිමි වේවා! එමෙන්ම අප වෙත හා අල්ලාහ්ගේ දැහැමි ගැත්තන් වෙත ද හිමි වේවා! නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවිදෙකු නොමැති බවට මම සාක්ෂි දරමි. එමෙන්ම නියත වශයෙන්ම මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔහුගේ ගැත්තා හා ඔහුගේ ධර්ම දූතයා බවට ද මම සාක්ෂි දරමි.

50

‘අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා සල්ලයිත් අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්, අල්ලාහුම්ම බාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්’

තේරුම: දෙවියනි, ඔබ ඉබ්රාහීම් හා එතුමාගේ පවුලේ උදවිය ප්රශංසාවට ලක් කළා සේ මුහම්මද් හා එතුමාගේ පවුලේ උදවිය ප්රශංසාවට ලක් කරනු මැනා! සැබැවින් ම ඔබ ප්රශංසනීය හා කීර්තිමත් ය. තව ද ඔබ ඉබ්රාහීම්ට හා එතුමාගේ පවුලේ උදවියට අභිවෘද්ධිය ඇති කළා සේ මුහම්මද්ට හා එතුමාගේ පවුලේ උදවියට අභිවෘද්ධිය ඇති කරනු මැනව! සැබිවින් ම ඔබ ප්රශංසනීය හා කීර්තිමත් ය.

51

ලුහර්-අසර්-මග්රිබ්-ඉෂා

52

සුබ්හු-ජුමුආ-දෙඅවුරුදු සලාතය

53

‘අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා සල්ලයිත් අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්, අල්ලාහුම්ම බාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්’

තේරුම: දෙවියනි, ඔබ ඉබ්රාහීම් හා එතුමාගේ පවුලේ උදවිය ප්රශංසාවට ලක් කළා සේ මුහම්මද් හා එතුමාගේ පවුලේ උදවිය ප්රශංසාවට ලක් කරනු මැනා! සැබැවින් ම ඔබ ප්රශංසනීය හා කීර්තිමත් ය. තව ද ඔබ ඉබ්රාහීම්ට හා එතුමාගේ පවුලේ උදවියට අභිවෘද්ධිය ඇති කළා සේ මුහම්මද්ට හා එතුමාගේ පවුලේ උදවියට අභිවෘද්ධිය ඇති කරනු මැනව! සැබිවින් ම ඔබ ප්රශංසනීය හා කීර්තිමත් ය.

54

‘අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලා’ ඔබට ශාන්තිය ද අල්ලාහ්ගේ කරුණාව ද ලැබේවා!

55

දෙවන රකආතයේ එතුමා වාඩි වූ විට වම් කකුළ ඉදිරියට දමා අනෙක් කකුල සිටුවා තබා තම නිතඹ මත වාඩි වූහ. මෙය ඉමාම් බුහාරි තුමා විසින් දන්වා ඇත.

56

තවර්රුක් ඉදුම

57

‘අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් අදාබි ජහන්නම, වමින් අදාබිල් කබ්රි, වමින් ෆිත්නතිල් මහ්යා වල් මමාති, වමින් ෂර්රි ෆිත්නතිල් මසීහිද් දජ්ජාල්’ අහෝ දෙවියනි! සැබැවින්ම නිරයේ දඬුවමින් ද කබ්ර් හෙවත් මිනීවලෙහි වේදනාවෙන් ද ජීවිත්වීමේ හා මරණයේ පරීක්ෂණයෙන් ද මසීහුද් දජ්ජාල්ගේ අර්බුධයේ

හානියෙන් ද ආරක්ෂාව මම ඔබෙන් පතමි. (මෙය මුස්ලිම් විසින් වාර්තා කොට ඇත.)

58

“අල්ලාහුම්ම ඉන්නී ළලම්තු නෆ්සියි ළුල්මන් කසීරා, වලා යඃෆිරුද්දුනූබ ඉල්ලා අන්ත, ෆඃෆිර්ලියි මඃෆිරතන් මින් ඉන්දික්, වර්හම්නි ඉන්නක අන්තල් ගෆූරුර් රහීම්” අහෝ දෙවියනි! මම මා හට ම බොහෝ අපරාධ කරගතිමි. පාපක්ෂමාව ලබා දීමට ඔබ හැර වෙනත් කිසිවෙකුත් නොමැත. එබැවින් ඔබ වෙතින් වූ සමාවක් වශයෙන් ඔබ මාගේ පාපයන් කමා කරනු මැනව! මා හට කරුණාව දක්වනු මැනව! සැබැවින් ම ඔබ මහා කාරුණික හා පාපක්ෂමාව ලබා දෙන්නා වේ.)

59

‘අස්තග්ෆිරුල්ලාහ්’ (තුන් වරක්) මම අල්ලාහ්ගෙන් සමාව අයැද සිටිමි.

60

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ තම ක්‍රියාවන් අතරින් පළමු ව විමසනු ලබන්නේ තම සලාතය පිළිබඳ ව ය. එය දැහැමි වූයේ නම් සැබැවින්ම ඔහු ජය ලැබීය. සාර්ථක කර ගත්තේ ය. නමුත් එම සලාතය විනාශ කර ගත්තේ නම් සැබැවින්ම ඔහු පරාජයට පත් විය. අලාභහානියක් සිදු කර ගත්තේය. මෙය අබූ දාවූද්, තිර්මිදි, හා නසාඊ යන ඉමාම්වරු විසින් දන්වා ඇත.

පටුන

No table of contents entries found

si187v1.0 - 03/09/2026